## බ්‍රහස්පතින්දා

පළමුවන කියැවීම ප්‍රඥා 7: 22 – 8: 1

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් ගත් පාඨයෙකි.

"ප්‍රඥාව වනාහි සදා ආලෝකයේ ප්‍රතිබිම්බය ය. දේව බලයේ අකලංක කැඩපත ය."

ප්‍රඥාව තුළ ඇති ආධ්‍යාත්මය තැණ නුවණින් යුක්ත ය. ශුද්ධවන්ත ය: ඒකීය ය. විවිධ ය: සියුම් ය: ක්‍රියාකාරී ය. කැපෙන සුලු ය: අකලංක ය: පැහැදිලි ය: පහර නොලබන සුලු ය: කාරුණික ය: මුවහත් ය: නොවැළැක්විය හැකි ය: ත්‍යාගශීලිය: මිනිසාට ප්‍රේම කරන සුලු ය: ස්ථිර ය: විශ්වාස කටයුතු ය: නොකැළඹෙන සුලු ය. සර්ව බලැති ය: සියල්ල දකින සුලු ය: සියලු නුවණ විනිවිද යන සුලු ය: පවිත්‍ර ය: ආධ්‍යාත්මය අතුරින් ඉතා සියුම් ය.

ප්‍රඥාව අන් සියල්ලට වඩා කාර්යක්ෂම ය. ඇය ඉතා පිරිසිදු බැවින් සියල්ල විනිවිද යයි: සියල්ල තුළ ව්‍යාප්ත වෙයි.

ප්‍රඥාව වනාහි දේව බලවේගයේ හුස්ම ය. සර්ව බලැති දෙවිඳුන්ගේ මහිමයෙන් නික්ම එන පවිත්‍ර ප්‍රභවය ය. එබැවින් අපවිත්‍ර කිසිවකට එහි ඇතුල් විය නොහැකි ය. ඇය සදා ආලෝකයේ ප්‍රතිබිම්බය ය. ක්‍රියාශීලි දේව බලයේ අකලංක කැඩපත ය. එතුමාණන්ගේ යහපත්කමේ ස්වරූපය ය.

හුදකලාව සිටින නමුත් ඇයට සියල්ල කළ හැකි ය. ඇය නොවෙනස් වන සුලු ය. ඇය සියල්ල අලුත් කරයි. සෑම පෙළපතක ම ශුද්ධවන්තයන් තුළට ඇය පිවිසෙයි. ඇය ඔවුන් දේව මිත්‍රයන් සහ දිවැසිවරුන් කරවයි. මන්ද, දෙවිඳුන් ප්‍රේම කරන්නේ ප්‍රඥාව සහිත ව ජීවත් වන මිනිසාට පමණක් ය. ඇය සූර්යයාට වඩා තේජාන්විත ය. ඇය සියලු තාරකා පංති අභිබවා බබලයි. ආලෝකය හා සැසඳූ විට ඇය මුල් තැන ගනියි. මන්ද, ආලෝකය රාත්‍රියට ඉඩ දිය යුතුයි. එහෙත්, නපුරට නම්, කිසිදා ප්‍රඥාව ජයගත නොහැකි ය.

පොළොවේ එක කොණක සිට අනික් කොණ දක්වා සියල්ල යහපතට මෙහෙයවමින්, ඇය සිය ශක්තිය භාවිතා කරයි.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 119: 89-91, 130, 135, 175

පිළිතුර : සමිඳුනි, ඔබේ වදන් සදාතනික ය.

ගීය : සමිඳුනි, ඔබේ වචනය සදාතනික ය,
එය තිර ලෙස සුරලොව ඇත.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවත්නේ ය.
ඔබ පොළොව පිහිටෙවූ සේක.
එය ස්ථිර ව පවතී.

ඔබේ නියමයන් ලෙස ඒ මැවිලි අද දක්වා පවතී.
මන්ද, සියල්ල ඔබට මෙහෙ කරයි.
ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ.
එයින් අනුවණයන්ට නුවණ ලැබේ.

දයාවෙන් අප දෙස බැලුව මැනව.
ඔබේ පණත් අපට ඉගැන්නුව මැනව.
ඔබට ප්‍රශංසා කරන පිණිස මට ජීවත්වන්නට ඉඩ දුන මැනව.
ඔබේ නියමයෝ මට උපකාරවත් වෙත්වා!

සුපුවත් ජය නද 1 පේදුරු 1: 25

ආලේලූයා! ආලේලූයා!
“සමිඳුන්ගේ වචනය සදහට ම පවතින්නේ ය.
මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්න ය.”
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද ජුවාම් 15: 15

ආලේලූයා! ආලේලූයා!
“මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ල ම ඔබට දන්වා වදාළ බැවින්,
මා ඔබට මිත්‍රයෝ ය යි කියමි” යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 17: 20–22

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

“දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහි ය.”

“දෙවියන් වහන්සේගේ රාජ්‍යය කවර කලෙක පහළ වන්නේ දැ” යි පරිසිවරුන් ඇසූ බැවින්, උන් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, “දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඇසට පෙනෙන අයුරින් නොපැමිණෙයි. මෙන්න මෙතැන ය, අන්න අතන ය යයි කිසිවකුට කිව නොහැකි ය. මන්ද, දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහි ය” යි වදාළ සේක.

උන් වහන්සේ ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක. “මනුෂ්‍ය–පුත්‍රයාණන් වැඩ සිටින දවස් වලින් එකක් වුව ද දැකීමට ඔබ ආශා වන කාලයක් පැමිණෙයි. එහෙත් ඔබ එය නොදක්නාහු ය. ‘අන්න අතැන ය. මෙන්න, මෙතැන ය’ යි ඔවුන් කියන කල, පිටත් වී, පසු පස්සේ නොයන්න. අහසෙහි එක් දිශාවකින් පහළ වන විදුලිය අහසේ අනෙක් දිසාව දක්වා බබලන්නාක් මෙන්, මනුෂ්‍ය–පුත්‍රයාණෝ පහළ වන දවසේ දී බබළන සේක. එහෙත් පළමු කොට, එතුමාණෝ බොහෝ දුක් විඳ මේ පරම්පරා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුත්තාහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.